**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**

**සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය**

# රියදුරු තනතුරු (PL – 3) ඇබෑර්තු

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), අපනයනය ප්‍රවර්ධනය සහ සංවර්ධනය කිරීම සඳහා වූ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වේ.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙහි උපාය මාර්ග සැලැස්මේ සඳහන්ව ඇති අපනයන ඉලක්ක ලඟා කර ගැනීම සඳහා දායකත්වය සැපයිය හැකි සනාථ වූ හැකියාවන්ගෙන් හෙබි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ඉහත සඳහන් තනතුර පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**<u>රැකියා විස්තරය</u>**

සඵලදායී ලෙස මණ්ඩලයේ වාහන පැදවීම හා නඩත්තු කිරීම.

**<u>සුදුසුකම්</u>**

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් විෂයන් දෙක (02) කට සම්මාන සහිතව විෂයන් හය (06) කින් සමත්වීම.

**<u>වෘත්තීය සුදුසුකම්</u>**

බර වාහන පැදවීම පිළිබඳ බලපත්‍රයක් ලබා තිබීම හා පිළිගත් ආයතනයකින් බර වාහන පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

**<u>වැටුප් ප්‍රමාණය</u>**

රු. 26,290/- 10 x 270 – 10 x 300 – 10 x 330 - 12 x 350 රු. 39,490/- (මාසික)

වැටුප්, අංක 02/2016 දරණ, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (DMS) චක්‍රලේඛණයේ ඇමුණුම II හි උපදෙස් පරිදි ගෙවනු ලැබේ.

**<u>වයස</u>**

අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. මෙම උපරිම වයස් සීමාව රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනවල අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**<u>තෝරා ගැනීමේ ක්‍රමය</u>**

ලිඛිත හා වෘත්තීය තරඟ විභාගයකින් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත.

**<u>වෙනත් ප්‍රතිලාභ</u>**

- පවුලේ සාමාජිකයන්ද ආවරණය වන පරිදි වෛද්‍ය ප්‍රතිකාර සඳහා වියදම් ප්‍රතිපූර්ණය කිරීම
- රජයේ අනුමත සහන පොලී ප්‍රමාණයන් යටතේ ආපදා ණය
- රජයේ අනුමත සහන පොලී ප්‍රමාණයන් යටතේ නිවාස ණය
- වාර්ෂික ප්‍රසාද දීමනා
- ලබා නොගත් වෛද්‍ය නිවාඩු මූල්‍යකරණය
- සේවක අර්ථසාධක අරමුදල - සේවකයාගෙන් 10%, ආයතනයෙන් 15%
- සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල - ආයතනයෙන් 3%

**<u>අයදුම් කිරීමේ පිළිවෙල</u>**

අදාල අයදුම්පත්‍රය ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මන්ඩලයේ 05 වන මහලේ පිහිටි මානව සම්පත් කළමනාකරණ අංශයෙන් හෝ www.srilankabusiness.com වෙබ් අඩවියෙන් (“Announcements” කාණ්ඩය යටතේ) ලබාගත හැක. සම්පූර්ණ ජීව දත්ත සඳහන් අයදුම්පත් අදාල සියළුම සහතික පත්‍රවල පිටපත් සමඟ 2017/07/27 වැනි දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට සභාපතිනිය සහ ප්‍රධාන විධායක වෙතට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ කෙළවරේ තනතුරු නාමය සඳහන් කළ යුතුයි.

රාජ්‍ය අංශයේ සේවකයන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු අතර, එම අයදුම්පතේ අමතර පිටපතක් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර මණ්ඩලය වෙත එවන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.


සභාපතිනිය සහ ප්‍රධාන විධායක

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

NDB / EDB ටවර්, අංක 42, නවම් මාවත,

කොළඹ 02.